ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2012 ජූලි මස 11 වැනි දින |

**මුදල් ප්‍රතිපත්ති විවරණය - 2012 ජූලි**

කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කර මනිනු ලබන උද්ධමනය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 2012 මැයි මාසයේ දී වූ සියයට 7.0 සිට ජූනි මාසයේ දී සියයට 9.3 ක් දක්වා ඉහළ ගිය අතර වාර්ෂික සාමාන්‍ය උද්ධමනය මැයි මාසයේ පැවති සියයට 5.6 සිට ජූනි මාසයේ දී සියයට 5.8 ක් දක්වා ඉහළ ගියේය.

2012 ජූනි මාසයේ දී උද්ධමනය ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2011 ජූනි මාසයේ දී අඩු පදනමක් පැවතීම, පවත්නා නියඟ තත්ත්වය දේශීය නැවුම් ආහාර මිල ගණන් කෙරෙහි අහිතකර ලෙස බලපෑම සහ මෑතක දී පරිපාලිත මිල ගණන්වල සිදුකරන ලද සංශෝධනයන්ය. මේ අතරම, මුදල් ප්‍රසාරණයවීම තුළින් පැනනගින ඉල්ලුම් අංශයේ පීඩනය අවම කිරීම සඳහා යොදාගන්නා ලද නොයෙකුත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස, පුළුල් මුදල් සැපයුමෙහි ($M_{2b}$) වර්ධනය, 2012 අප්‍රේල් මාසයේ වූ සියයට 22.9 සිට 2012 මැයි මාසයේ දී සියයට 20.9 ක් දක්වා අඩු වූ අතර වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි වර්ධනය 2012 මාර්තු මාසයේ දී පැවති එහි ඉහළම අගය වූ සියයට 35.2 සිට 2012 මැයි මාසයේ දී සියයට 33.5 ක් දක්වා අඩු විය. මේ අනුව, වසරේ පළමු මාස පහ තුළ දී පෞද්ගලික අංශයට ලබාදුන් ණය වර්ධනය වූයේ සියයට 10.5 කින් පමණි.

මේ අතර 2011 වසරේ දී වාර්තාගත වූ ඉහළම අගයයන් සමග සැසඳීමේ දී තාවකාලික දත්තවලට අනුව, මෙම වසරේ පළමු මාස පහේදී ආනයන වියදමෙහි වර්ධනය, වෙළෙඳ හිඟය අඩුකරමින්, ශීඝ්‍රයෙන් පහළ බසිමින් පවතියි. ගෝලීය වශයෙන් පවතින ඉල්ලුම අඩුවීමත් සමග බොහොමයක් වෙළෙඳ ද්‍රව්‍යයන්හි ජාත්‍යන්තර මිල ගණන් ද පහළ බැසීමේ ප්‍රවණතාවක් පවතින අතර, එමඟින් ශුද්ධ පදනම මත මෙම වසරේ රටේ ආනයන මත වන පීඩනය තවදුරටත් ලිහිල් විය යුතු වුවද, ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම තවදුරටත් මන්දගාමීව සිදුවීම අපනයන ආදායමට ද අහිතකර ලෙස බලපානු ඇත.

විදේශීය අංශය තුළ, ශ්‍රී ලංකාව 2012 ජූනි මාසය අවසානය වන විට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සම්පස්ත ණය පහසුකම අනුව ඇති කරගත් සියලුම ඉලක්කයන් සපුරාගැනීම නිසා එම පහසුකම යටතේ වූ අවසාන වාරිකය ලැබීමට සුදුසුකම් ලැබීය. මෙම වාරිකය ලැබීම සහ අපේක්ෂිත අනෙකුත් සැලකිය යුතු මට්ටමේ විදේශ විනිමය ලැබීම් සමග ඉදිරි මාසවල දී රටේ විදේශීය අංශය වඩාත් ශක්තිමත් වනු ඇති අතර, 2012 මැයි මස 31 වැනි දින වන විට මාස 3.4 ක ආනයනවලට සමාන වන එ.ජ.ඩොලර් මිලියන 5,815 ක් ලෙස පවතින දළ නිල සංචිතය ද වර්ධනය වනු ඇත.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් සහ දැනටමත් ගෙන ඇති මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග යටතේ වූ වර්ධනයන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීමෙන් අනතුරුව, 2012 ජූලි මස 10 වැනි දින පැවති රැස්වීමේ දී මුදල් මණ්ඩලය විසින් මහ බැංකුවේ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙළින් සියයට 7.75 සහ සියයට 9.75 ක් ලෙස පවත්වාගෙන යාමට තීරණය කරන ලදී.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය සිදුකරනු ලබන දිනය යථා කාලයේ දී ප්‍රකාශයට පත්කරනු ඇත.